**අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල - 2013**

-----------------------------------------------------------------------------------------------------------

අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 44 දරන අම්බුළුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂපත්‍රයේ හා ආදායම් ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

## 2.1 මතය ව්‍යාචනය

------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පදනම් කරගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති (ක්ෂය ප්‍රතිපත්තිය හැර) අනාවරණය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා භාරකාරවරයා විසින් පවත්වාගෙන යනු ලබන ලේජරය අනුව අම්බුළුවාව භාර අරමුදල වෙනුවෙන් ඉකුත් වර්ෂවල පුනරාවර්තන වියදම් රු.20,109,170 ක් හා මූලධන වියදම් රු.2,600,000 ක් වැයකර තිබුනද, එම වියදම් හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී දරන ලද පුනරාවර්තන වියදම් රු.2,662,147 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) 2012 වර්ෂයට පෙර පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වතුර මෝටර් 04 ක්, අත් ට්‍රැක්ටර් එන්ජිමක් සහ ජෙනරේටරයක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී ඉදිකිරීම් සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම රු.6,991,649 ක් අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ සේවක අර්ථසාධක අරමුදල් දායකය රු.222,820 කින් හා සේවක භාරකාර අරමුදල් දායකය රු.36,179 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළව උද්‍යාන සේවක වැටුප වශයෙන් ගෙවා තිබූ රු.152,800 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඊ) 2009 ඔක්තෝබර් සිට 2012 දෙසැම්බර් 31 දක්වා හා සමාලෝචිත වර්ෂයේ හිඟ පොළී ආදායම පිළිවෙලින් රු.2,309,589 ක් හා රු.750,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(උ) ස්ථාවර වත්කම් සියයට 5 බැගින් ක්ෂය කරනු ලබන බවට මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණ ද, එකතු වටිනාකම රු. 332,580,000 ක වත්කම් සම්බන්ධයෙන් ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) දුරකථන සමාගම් 02ක් සමඟ ඇති කරගන්නා ලද ගිවිසුම් ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළ කුළුණු ආදායම රු.442,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු වටිනාකම රු.2,923,500 ක් වූ ආදායම් විෂයයන් 02 ක් සම්බන්ධයෙන් රිසිට්පත්, ආදායම් ලේඛණ හා වලංගු බඳු ගිවිසුම් ඉදිරිපත් නොකෙරුණි.

(ආ) එකතු වටිනාකම රු.347,580,000 ක් වූ වත්කම් සම්බන්ධයෙන් ලේජර් ගිණුම්,භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා ස්ථාවර වත්කම් ලේඛනය ද රු. 347,784,932ක වගකීම් සම්බන්ධව ලෙජර් ගිණුම් ද පවත්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ HM-4784 හා KI-2084 අංක දරණ වාහන දෙක වෙනුවෙන් රු.231,150 ක මුදලක් අළුත්වැඩියා වියදම් හා රු.83,581 ක මුදලක් රක්ෂණ වාරික සඳහා අරමුදල වෙනුවෙන් මහා භාරකාරවරයා විසින් වියදම් කර තිබුණ ද අරමුදල සතුව එවැනි වාහන 02 ක් ඇති බවට මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් නොවුණි.

(ඇ) වටිනාකම රු.2,100,616 ක් වූ භාණ්ඩ මිලදී ගැනීම් සම්බන්ධයෙන් ද්‍රව්‍ය ලැබීම් හා දෛනිකව වැඩ බිම් වෙත නිකුත් කිරීම් තොග පොත්වල සටහන් කර නොතිබුණි.

**2.2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 395 (ඇ) | එක් එක් මාසය අවසානයේ බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ පීඑෆ්/423 හා 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | |
| i. 4.1 (අ) වගන්තිය | අරමුදලෙහි අරමුණුවලට අනුකූලව සැකසූ වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| ii. 4.3 වගන්තිය | වගන්තියේ "ඇ" සිට "ඊ" දක්වා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.2,928,833 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,474,811 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,454,022 ක පිරිහීමක් දක්නට ලැබුණි.

**3.2 ආදායම් පරිපාලනය**

---

ඉතා ආකර්ශණීය දර්ශනතලයකින් යුත් අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණය මහනුවර, නුවරඑළිය මාර්ගයට නුදුරින් පිහිටා තිබුණත්, සමාලෝචිත වර්ෂයේ විදේශීය සංචාරකයින් පැමිණ තිබුණේ 1,613 පමණක් වූ අතර, ඉන් උපයාගත් ආදායම රු.483,900 ක් විය. සංචාරක ආකර්ශණය වැඩිවන ආකාරයෙන් පුළුල් ප්‍රචාරණයක් ලබා නොදීම හේතුවෙන් උපායාගත හැකිව තිබූ විශාල ආදායමක් අහිමි වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අම්බුළුවාව ජෛව විවිධත්ව ඒකකයේ පිවිසුම් ස්ථානයේ රු.1,270,000 ක් වියදම් කර ඉදිකරන ලද කඩකාමර 03 කින් යුත් ගොඩනැගිල්ල ඉදිකර වසර 03 ක් පමණ ගතවී ඇතත් ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රදාන රු.10,500,000 ක් යොදා ඉදිකළ සියළු පහසුකම් සහිත සංචාරක නිවාස 02 ක් අරමුදල සතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ රු.41,500 ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි.

(ඇ) රජයේ ප්‍රදාන රු.1,800,000 ක් යොදා ඉදිකළ කැපටේරියා අවන්හල හා ඊට අයත් ගෘහ භාණ්ඩ ද සමඟ බාහිර පාර්ශවයක් වෙත ව්‍යාපාරික කටයුතු කරගෙන යාම සඳහා ගිවිසුමකින් තොරව ලබා දී තිබූ නමුත් ඉන් අරමුදලට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි.

**4.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

මිල කැඳවීම්, ටෙන්ඩර් ප්‍රදානය, ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීම, අවසන් බිල්පත්‍ර හා කළ වැඩ සඳහා තහවුරුවක් ලබා ගැනීම ආදියෙන් තොරව රු.4,437,872 ක මුදලක් ගොවිජන වෛත්‍යාට යන මාර්ගය පුළුල් කිරීම වෙනුවෙන් ද, රු.879,900ක මුදලක් තේ, පොල්, රබර් පර්යේෂණ මධ්‍යස්ථානය අසල බැම්මට පස් පිරවීම වෙනුවෙන් ද රු.1,029,000 ක මුදලක් අතුරු මාර්ගය කැපීම වෙනුවෙන් ද සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

**4.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

රජයෙන් ප්‍රදාන රු.10,000,000 ක් භාවිතා කරමින් ඉදිකළ අංග සම්පූර්ණ සම්මන්ත්‍රණ ශාලාවක් අරමුදල සතුව පැවතියත් ඉකුත් වර්ෂයේ හෝ සමාලෝචිත වර්ෂයේ සම්මන්ත්‍රණ පැවැත්වූ බවට තහවුරුවක් නොවුණි.

**5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2006 දෙසැම්බර් 22 දිනැති PF/423 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසර 04 කට වැඩි කාලයක් ප්‍රමාද වී 2018 දෙසැම්බර් 07 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

**5.2 කාර්ය සාධනය**

--------------------

අම්බුළුවාව ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදලේ 2009 අංක 44 දරන පනතේ 4 වගන්තියේ (අ) සිට (ත) දක්වා වූ අරමුණු 20 න් අරමුණු 4 ක් හැරුණු විට අනෙක් අරමුණු ඉටුකිරීම සඳහා අරමුදල කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් පාලනය
(ආ) තොග පාලනය
(ඇ) වත්කම් පාලනය